C
913

# ලංකාවේ ටෙරාකොටා කර්මාන්ත

කහගේ හේමන්ත ජයතිලක

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

ශාස්ත්‍රපති උපාධිය (M.A.) සඳහා පේරාදෙණිය
විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරන ලද නිබන්ධනය

(පළමුවන කොටස)

1983 මැයි

371917

## පෙරවදන

මෙම නිබන්ධනයේ මූලික අරමුණ වෙරාකොටා නිර්මාණය කිරීම සඳහා පැරණි කලාකරුවන් විසින් අනුගමනය කරන ලද ශිල්ප ක්‍රම අධ්‍යයනය කිරීම ය. මෙම හේතුව නිසා ම සීමිත කාල පරිච්ඡේදයක් ඇතුළත නිර්මාණය වූ වෙරා-කොටා ගැන පරීක්ෂා කිරීමක් නොකොට ඉපැරණි ම කෘතියේ සිට වර්තමාන නිර්මාණ දක්වා ම කරුණු සොයා බැලීමට සිදු විය.

ශිල්පී ක්‍රම අධ්‍යයනයේ දී එක් එක් වෙරාකොටා කෘතියක් වෙන් වෙන් වශයෙන් ගෙන සොයා බැලීමට සිදු විය. පැරණි කෘති සඳහා භාවිත කරන ලද ශිල්පී ක්‍රම වඩාත් පැහැදිලි ව වටහා ගත හැකි වූයේ එසේ කරන ලද පරීක්ෂාවෙනි. මේ අන්දමට සොයා ගත් කරුණු තහවුරු කර ගැනීමට හා එම ශිල්පී ක්‍රමවල පාරම්පරික බවක් ඇත්තේ ද යන්න සොයා බැලීමට වර්තමාන මැටිකලා කරුවන් පිළිබඳ ව ද කරුණු හැදෑරීමට සිදු විය.

මැටි කලාව පිළිබඳ හැඳින්වීමක් පළමු පරිච්ඡේදයෙන් ඉදිරිපත් කැරෙන අතර සාකච්ඡා කරනු ලබන ක්ෂෙත්‍රය පිළිබඳ පසුබිමක් ඉන් ඉදිරිපත් කැරෙයි. මේ දක්වා විවිධ වියතුන් විසින් මේ විෂය ක්ෂෙත්‍රය පිළිබඳ දක්වා ඇති අදහස් සම්පිණ්ඩණය කොට දැක්වීමත්, ම විසින් කරන ලද පිරික්සුම්වල දී ලද අදහස් ඉදිරිපත් කිරීමත් විෂය ක්ෂෙත්‍රය යටතේ සිදු ව ඇත. විෂය ක්ෂෙත්‍රය පිළිබඳ සාකච්ඡා කිරීම මෙයට වඩා පුළුල් ව සිදු කළ යුත්තකි. ඒ යටතේ නිගමන කෙටි සාකච්ඡාවකින් පසුව ගැනීමට හැකි නොවේ. නිගමන වශයෙන් අදහස් ඉදිරිපත් කිරීමට ඒ පිළිබඳ ගැඹුරු පර්යේෂණයක් කිරීම අත්‍යවශ්‍ය කරුණක් වේ. මෙහි 'නිගමනය' යටතේ සිදු කොට ඇත්තේ ද එවන් කරුණු රැසක් පෙළ ගැස්වීම පමණකි.

ටෙරාකොටාවන් පිළිබඳ දීර්ඝ විස්තරයක් හා ඒ පිළිබඳ නාමාවලියක් ද ඡායාරූප හා රේඛා සටහන් ද මෙහි අවසානයේ දක්වා ඇත. වෙන් වෙන් වශයෙන් ටෙරාකොටා පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීමෙන් මෙම රචනයේ මූලික පරමාර්ථ වෙත වඩාත් හොඳින් ළඟා වීමට උත්සාහ ගෙන ඇත. විශේෂයෙන් එහි ශිල්පීය ලක්ෂණත්, ටෙරාකොටාව පිළිබඳ විෂයගත ස්වරූප-යත් ඉන් එළි දැක් වේ. තෙවැනි පරිච්ඡේදය තුළින් විස්තර නොවන සියුම් වූ ශිල්පීය අංශයක් පිළිබඳ තොරතුරක් එම තෝරා ගත් ටෙරාකොටා නිර්මාණ පිළිබඳ විස්තර තුළින් දක්නට හැකි ය. ඡායාරූප සමඟ ම ඒවායේ නිදහස් රේඛා චිත්‍ර ද ඉදිරිපත් කොට ඇත්තේ ඡායාරූපවලින් පැහැදිලි නොවන සියුම් විස්තරයක් ගෙනහැර දැක්වීමට සහ ඒවායේ මූලික හැඩය පිළිබඳ වැටහීමක් ලබාදීමට ය. නාමාවලියේ ඇතැම් කොටස් හිස් ව තබන ලද්දේ ඒ පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගැනීමට අපහසු වීම හා මේ දක්වා අංක නොයෙදීම නිසාවෙනි. සමහර කෘතියක් පිළිබඳ කිසිම තොරතුරක් හෝ සටහනක් කෞතුකා-ගාරවලින් ලබා ගැනීමට නොහැකි විය. නාමාවලිය, සටහන් අංක 1 සහ සටහන් අංක 2 ම විසින් තෝරා ගන්නා ලද ටෙරාකොටා නිර්මාණවල අත්‍යවශ්‍ය තොරතුරුවල සම්පිණ්ඩනයක් සමගි.

ලංකා සිතියමේ ටෙරාකොටා නිර්මාණ ලැබුණු ස්ථාන දැක්වීමෙන් අදහස් කළේ එම ස්ථාන නියමාකාර ව දැක්වීමට වඩා එම කලාවේ පැතිරී යාම පිළිබඳ අදහසක් ඇති කරවීම ය.